# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී පාලි මණ්ඩපය

## විශ්වවිද්‍යාල ප්‍රවේශය - 2023/2024 අධ්‍යයන වර්ෂය

**කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයේ ජනමාධ්‍ය ශාස්ත්‍රවේදී ගෞරව/ප්‍රසංග කලා ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාවන් සඳහා 2023 /2024 අධ්‍යයන වර්ෂයට විද්‍යාර්ථයින් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම.**

ඉහත සඳහන් උපාධි පාඨමාලාවන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කර ඇති විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි සඳහන් තොරතුරු වලට අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබාගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් මෙම යෝග්‍යතා පරීක්ෂණයට අයදුම්කර පෙනී සිට උසස් ප්‍රවීණත්වයක් පළ කළ යුතුය.

- **යෝග්‍යතා පරීක්ෂණයට අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය**

  සියලුම අයදුම්කරුවන් ශ්‍රීපාලි මණ්ඩප වෙබ් අඩවිය හි (https://spc.cmb.ac.lk) ඇතුළත් අයදුම්පත්‍රය මාර්ගගතව (online) සම්පූර්ණ කළ යුතුය. එසේ සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලිපි ලේඛන උඩුගත (upload) කළ යුතුය.

  1. පාසලේ විදුහල්පති, සමාදාන විනිසුරුවරයෙකු හෝ රජයේ විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද අ.පො.ස. (උ.පෙ.) 2023 ප්‍රතිඵල ලේඛනයේ සහ අ.පො.ස. (සා.පෙ.) විභාග ප්‍රතිඵල ලේඛනයේ (ඉංග්‍රීසි විෂය සමත්) ස්කෑන් (scan) පිටපත් වෙබ් අඩවියෙන් ලබාගන්නා ලද ප්‍රතිඵල ලේඛන ද ඉහත පරිදි සහතික කළ යුතුයි.
  2. යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලැබීමට අවම වශයෙන් අ.පො.ස. (සා.පෙ.) ඉංග්‍රීසි විෂය සඳහා "S" සමාර්ථයක් තිබිය යුතු ය. (විශ්වවිද්‍යාල අත්පොතෙහි සඳහන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය වන අවම සුදුසුකම් වලට අමතරව)
  3. ඔබගේ ජාතික හැඳුනුම්පතෙහි දෙපසෙහිම පැහැදිලි ඡායාරූප (image).
  4. අදාළ මුදල ගෙවා ලබා ගත් රිසිට් පතෙහි ස්කෑන් (scan) පිටපතක්,

- **යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු**

  ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ශ්‍රීපාලි මණ්ඩපයේ ගිණුම් අංක 0000719939 දරන ලංකා බැංකුවේ හොරණ ශාඛාවේ ගිණුමට බැර කරන ලද මුදල් තැන්පත් පතෙහි (deposit slip) ඔබගේ නම සහ හැඳුනුම්පත් අංකය පැහැදිලිව සඳහන් කර ස්කෑන් (scan) පිටපතක් යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු වශයෙන් අයදුම්පත්‍රය සමග උඩුගත (upload) කළ යුතුය. (ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය (ATM), චෙක්පත්, තැපැල්/ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.)

  යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු වශයෙන් එක් විෂය ක්ෂේත්‍රයක් වෙනුවෙන් රු: 2,000/- ක මුදලක් අය කරනු ලැබේ. ඔබ විසින් අයදුම්කරනු ලබන විෂය ක්ෂේත්‍ර සඳහා පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතුය.

  - ජනමාධ්‍ය ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව – 2,000.00
  - ප්‍රසංග කලා ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව

  ප්‍රසංග කලා ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් යටතේ පහත සඳහන් පරිදි මුදල් ගෙවා යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

| | | |
|---|---|---|
| **නැටුම්** | - | **රු. 2,000.00** |
| **සංගීත** | - | **රු. 2,000.00** |
| **නාට්‍ය හා රංග කලාව** | - | **රු. 2,000.00** |
| **චිත්‍ර හා සැලසුම්කරණය** | - | **රු. 2,000.00** |
| **සිනමා අධ්‍යයනය** | - | **රු. 2,000.00** |

  තම කැමැත්ත පරිදි විෂය ක්ෂේත්‍ර එකකට හෝ කිහිපයකට පෙනී සිටිය හැක. අයදුම් කරන එක විෂයකට රු.2,000 /- බැගින් ඉහත සඳහන් පරිදි ගෙවිය යුතුය.

  යෝග්‍යතා පරීක්ෂණ අයදුම්පත පිරවීම සඳහා උපදෙස් ශ්‍රීපාලි මණ්ඩප වෙබ් අඩවියෙහි ඇති "Aptitude Test – 2024" වෙත පිවිසීමෙන් ලබාගත හැකි අතර, යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන සිසුන් වෙනුවෙන් ප්‍රායෝගික/ වාචික පරීක්ෂණයක් ශ්‍රී පාලි මණ්ඩප පරිශ්‍රයේදී අගෝස්තු මස අවසන් සතියේ සිට පැවැත්වීමට අපේක්ෂිතය.

- **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය**

  මාර්ගගතව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (Online Application) අදාළ ලියකියවිලි සමග 2024.08.07 දින ප.ව. 11.59 ට හෝ එදිනට පෙර යොමු කළ යුතුය. මෙම දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**මණ්ඩපාධිපති (වැ.බ.)**
**2265553**
**ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය,**
**වෑවල, හොරණ.**
**2024.07.19**

**දුරකථන අංක : 034-2212919, 034-**
**විද්‍යුත් ලිපිනය : aptitude@spc.cmb.ac.lk**
**නිල වෙබ් අඩවිය : https://spc.cmb.ac.lk**